ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2018/2019

අවසාන පරීක්ෂණය - 2019

අධ්‍යාපනයේ පදනම - ESU3212/STU5512

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.12 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. "ළමයාගේ අධ්‍යාපනය ඔහුගේ හැකියාවන්, අවශ්‍යතාවන් හා ලැදියාවන්ට අනුකූලව ලබාදිය යුතුය." රූසෝ-

    ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දෙකක් (0o2) සඳහන් කරන්න.

02. "අධ්‍යාපනය" සහ "පුහුණුව" අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්ලේටෝ ඉදිරිපත් කල විෂයමාලාවේ මූලික ලක්ෂණ තුන (03) නම් කරන්න.

04. අධ්‍යාපන පරමාර්ථ හා අධ්‍යාපන අරමුණු පැහැදිලි කරන්න.

05. සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පාසලේ භූමිකා පහක් (05) සඳහන් කරන්න.

06. අධ්‍යයන කේන්ද්‍රීය සමාජයක ලක්ෂණ තුනක් (03) නම් කරන්න.

07. ශ්‍රී ලංකාවේ මධ්‍ය පංතියේ දැකිය හැකි ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

08. රටක පූර්ණ සංවර්ධනය සඳහා අධ්‍යාපනයට දායක විය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) සමාජ දෘෂ්ටිකෝණය අනුව අධ්‍යාපනය මඟින් ඉටුකළ යුතු කාර්යයන් හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) ජෝන්ඩූවී ඉදිරිපත් කළ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ අදහස් ශ්‍රී ලංකාවේ ද්විතියික පංති කාමරය තුළ කොතෙක් දුරට ක්‍රියාත්මක වන්නේ දැයි විභාග කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාව මුහුණපා ඇති අධ්‍යාපන ගැටලුවලට පිළියම් සෙවීමේදී ජෝන්ඩූවී ගේ අධ්‍යාපන යෝජනා යොදා ගත හැකි ආකාරය නිදසුන් දෙකක් **(02)** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. (i) "ආකල්ප" සහ "සාරධර්ම" යන සංකල්ප කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) සාරධර්ම අධ්‍යාපනය ලබාදීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) "යහපත් ජීවන දර්ශනයක් ගොඩනැගීම සඳහා සාරධර්ම විශාල දායකත්වයක් සපයයි." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර නිදසුන් දෙකක් **(02)** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) ප්‍රාථමික සමාජානුයෝජනය සහ ද්විතියික සමාජානුයෝජනය යන සංකල්ප නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) දරුවන් සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පවුල මුහුණ දෙන අභියෝග තුනක් **(03)** පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) සමාජානුයෝගීකාරකයක් වශයෙන් සමවයස් කණ්ඩායම්වල වැදගත්කම විභාග කරන්න. (ලකුණු 08)

12. (i) සමාජ සචලනය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) පුද්ගලයින්ගේ සමාජ සචලතාව ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනය දායකත්වය ලබා දෙන්නේ ද? සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) පහළ ප්‍රාන්තික දරුවන්ගේ අධ්‍යාපන ගැටලු තුනක් **(03)** දක්වා ඒවා අවම කර ගැනීමට අනුගමනය කළ හැකි යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. (i) යාවජීව අධ්‍යාපනය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) යාවජීව අධ්‍යාපනය ලබා ගැනීමට වර්තමාන ශ්‍රී ලංකාවේ තිබෙන අවස්ථා නිදසුන් **දෙකක් (02)** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සැමට අධ්‍යාපනය සංකල්පය ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක් (03)** විභාග කරන්න. (ලකුණු 08)

14. (i) සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත ගැටලු විසඳා ගැනීම සඳහා මහත්මා ගාන්ධිගේ අධ්‍යාපනික අදහස් යොදා ගත හැකි ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 08)

(iii) ශිෂ්‍යයන් වැඩ ලෝකයට සූදානම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනය තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.

0001

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF EDUCATION

BACHELOR OF EDUCATION DEGREE (NATURAL SCIENCE)

PROGRAMME – 2018/2019

LEVEL - 05

FINAL EXAMINATION 2019

ESU3212/STU5512 – FOUNDATIONS OF EDUCATION

DURATION – THREE (03) HOURS

Date: 12.02.2019 Time: 9.30 a.m. – 12.30 p.m.

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. "The child's education should be in accordance with his/her abilities, needs and interests" **Rousseau.**
    Do you agree with the above statement? Mention **two (02)** reasons.

02. Briefly explain the difference between "Education" and "training".

03. Name the **three (03)** basic features of curriculum presented by Plato.

04. Explain Educational Aims and Educational Objectives.

05. State **five (05)** roles of the school in the process of socialization.

06. Name **three (03)** characteristics of a Learning-centered Society.

07. State **five (05)** characteristics that are visible in the middle class in Sri Lanka.

08. Briefly describe how education can contribute to the total development of a country.

(5 x 8 = 40 marks)

## PART - II

09. i. Name **four (04)** tasks that should be fulfilled by education from the Perspective of Society.

(04 marks)

ii. Examine to what extent the ideas presented by John Dewey on "Teaching Methods" are applied in the secondary classroom in Sri Lanka.

(08 marks)

iii. Discuss with **two (02)** examples how educational suggestions made by John Dewey could be utilized when searching for solutions for the educational problems faced by Sri Lanka.

(08 marks)

10. i. Briefly describe the concept of "Attitudes" and "Values".

(04 marks)

ii. Examine the role of the teacher in providing value education.

(08 marks)

iii. "Values contribute to develop a good philosophy in life".
Do you agree with the above statement? Explain your answer with two examples.

(08 marks)

11. i. Define the concepts of Primary Socialization" and "Secondary Socialization".

(04 marks)

ii. Examine **three (03)** challenges faced by family in the process of Socialization of children.

(08 marks)

iii. Examine the importance of peer group as an agent of socialization.

(08 marks)

12. i. Define "Social Mobility".

(04 marks)

ii. Does education contribute to the promotion of social mobility of people? Discuss.

(08 marks)

iii. State **three (03)** educational problems of lower class children and make suggestions to minimize those problems.

(08 marks)

13. i. What is meant by Life-long Education?

(04 marks)

ii. Explain with **two (02)** examples the opportunities available in Sri Lanka to obtain Life-Long Education.

(08 marks)

iii. Examine **three (03)** steps taken by Sri Lanka to achieve the concept of "Education for All".

(08 marks)

14. i. Name **four (04)** educational problems faced by Sri Lanka as a developing country.

(04 marks)

ii. Examine the views of Mahathma Gandhi can be applied to solve the above problems.

(08 marks)

iii. Evaluate the steps taken by the secondary education systems in Sri Lanka to prepare students for the World of Work.

(08 marks)

*-Copyrights reserved-*